මාධ්‍ය නිවේදන අංක 04

මැතිවරණ කොමිෂන් සභාව

2021 ජනවාරි මස 21 දින රැස්වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන තීරණ ගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

- දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීමේ දී 1981 අංක 01 දරණ පාර්ලිමේන්තු පනතේ විධිවිධාන ප්‍රකාරව ඊට අනුරූපී නිර්ණායක නිශ්චිතව නොතිබීම නිසා පනතේ විධිවිධාන අනුව එම නිර්ණායක සකස් කොට ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කිරීම.

- 1981 අංක 01 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත සඳහන් මැතිවරණ කාර්යයන් සඳහා 2021 වර්ෂය වෙනුවෙන් දේශපාලන පක්ෂ වෙත වෙන් කර දී ඇති ලකුණු හා දේශපාලන පක්ෂ වෙත මෙතෙක් වෙන්කර දී නොමැති ලකුණු වෙන් වෙන් වශයෙන් රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම.

- වන්නි මැතිවරණ කොට්ඨාසයේ පදිංචිය නොමැති වීම හේතුකොට ගෙන ඡන්දහිමි නාමලේඛනයේ නම් ඉවත් කොට ඇති පුද්ගලයන් සඳහා 2020 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට නම ඇතුළත් කර ගැනීම සඳහා වන හිමිකම් ඉල්ලුම් කිරීමේ කාලය මේ වන විට ඉකුත්ව තිබුණ ද ඔවුන්ගෙන් ලැබෙන ඉල්ලීම් සලකා බැලීමට සහ පදිංචිය තහවුරු කිරීම සඳහා පරීක්ෂණ අවස්ථා ලබා දීම. එසේ වුව ද තවදුරටත් අවතැන් කඳවුරුවල පදිංචිකරුවන් වේ නම් පමණක් ඔවුන් පූර්වයේ ලියාපදිංචි කළ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කිරීම

හේ.මු.ති.දී. හේරත්
ලේකම්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2021 ජනවාරි මස 22